## මිළඟ පාර්ලිමේන්තුව කුමක් සඳහා විය යුතු ද III

මීළඟ පාර්ලිමේන්තුවේ ප්‍රධාන ම කාර්යභාරය වනුයේ රටේ ඒකීයභාවය හෙවත් එක්සේසත්බව රැකීම ය. අප කලින් සඳහන් කළාක් මෙන් එ ජ නි සංධානයේ ඇතැම් මන්ත්‍රීවරුන් තවමත් අනුගමනය කරන්නේ චන්ද්‍රිකාගේ සන්ධීය හා සහසන්ධීය ප්‍රතිපත්තිය ය. ඔවුන් පාර්ලිමේන්තුවට නොඑවීම රටේ යහපතට හේතුවනු ඇත. අද ඒකීයබව වෙනුවෙන් පෙනී සිටින ඇතැමුන් 1986 සිට ම දිගට ම කොටි පරාජය කිරීම වෙනුවෙන් සටන්කළ බව පැවසුවත් එහි ඇත්තක් නැත. 1986 දී අප සමග සිටි ඇතැම්හු 1992 වන විට ජාතිය මළකඳක් යන ස්ථාවරය මත ඊනියා යුද්ධයට විරුද්ධ වූහ. 1995 මුල දී ද ඔවුහු මිතුරු කල්ලියක් ලෙස ඊනියා යුද්ධයට විරුද්ධව පෝස්ටර් ඇළවූහ. පසුව ඉල්ලුමක් ඇතැයි යන පදනමෙන් ඔවුහු ජාතිකත්වය වෙතට නැවත පැමිණියහ. තවත් අය ලක්මිණ පුවත්පතෙහි අප ඊනියා යුද්ධයට පක්ෂව ලියන කළ අපට විරුද්ධව කැරළි ගැසූහ. ඒ පුවත්පතෙහි කතුවැකි ලියූ මා ඒ කාර්යභාරයෙන් ඉවත්කිරීම සඳහා රංචු ගැසූ ඔවුහු අවසානයේ දී මා එයින් ඉවත්කළහ. ඒ සමග බෙංගමුවේ නාලක හිමියන්ට පුවත්පත සමග සම්බන්ධකම් පැවැත්වීමට නොහැකි තැනට කටයුතු කළහ. මොවුන්ගේ අතීතය ජරාජීර්ණ වුවත් පසුගිය දා කොටි පැරදවීම සඳහා ඔවුහු සහාය දුන්හ. ඔවුන්ට මනාපය දීමෙන් ඒ පිළිබඳ අපේ කෘතඥතාව පළකළ හැකි ය. එමෙන් ම අද ඔවුහු ඒකීය රාජ්‍යය වෙනුවෙන් පෙනී සිටිති. එහෙත් 1986 සිට ම දිහින් දිගට ම තමන් ඊනියා යුද්ධයට පක්ෂව හා ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටි බව කිවහැක්කේ ම එ පෙරමුණට, භූමිපුත්‍ර පක්ෂයට හා ඇතැම් ශ්‍රී ල නි ප මන්ත්‍රීවරුන්ට ය. ඔවුන් හඳුනාගැනීම ජනතාවට භාර ය.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අලුත් මතයක් දැන් ප්‍රචාරය වෙමින් පවතියි. ඒ දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයෙහි නීත්‍යානුකූලභාවය පිළිබඳ ව ය. පනත හදිසියේ සම්මත කළ බවත් ඉන්දියාවේ අවශ්‍යතාව අනුව ඒ සිදුකළ බවත් පැහැදිලි ය. එහෙත් එපමණකින් එහි නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක්කළ හැකි නො වේ. එයට වඩා ප්‍රබල තර්කයක් අද ඒ විනිශ්චය මණ්ඩලයේ ඇතැම් සාමාජිකයන්ගෙන් මතුවෙයි. දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ බව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරවරු හතරදෙනෙක් ද ව්‍යවස්ථාවට පටහැණි බව විනිශ්චයකාරවරු හතරදෙනෙක් ද තීරණය කළහ. අනෙක් විනිසුරු එහි ඇතැම් වගන්තියක් ජනමත විචාරණයකට භාජනය කළ යුතු බව ප්‍රකාශ කෙළේ ය. එය අදාළ ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ ද නැද්ද යන්න පිළිබඳව දුන් නිශ්චිත තීන්දුවක් නො වේ. ජේ ආර් ජයවර්ධන කෙළේ ඒ තීන්දුව ද ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමග එකඟ බවට කළ එකක් සේ සළකා දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සම්පාදනය කිරීම ය. එය ක්‍රම විරෝධී වෙයි. සම්මත ක්‍රම වේදය අනුව විනිශ්චයකාරවරුන් හතරට හතරක් ලෙස බෙදී ප්‍රකාශකරන තීන්දු ක්‍රියාත්මක කළ නො හැකි ය. දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය නීත්‍යානුකූල නොවන්නේ යැයි එලෙස නිගමනය කළ හැකි ය. එසේ නම් මිළඟ පාර්ලිමේන්තුවට තුනෙන් දෙකේ බහුතරයකින් දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමට නෛතික මෙන් ම සදාචාරාත්මක අයිතියක් ද වෙයි.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්නේ නම් ඊනියා ජනවාර්ගික ප්‍රහ්නය විසඳන්නේ කෙසේ දැයි පඬියන් ප්‍රශ්න කරනු ඇත. එයට පිළිතුර මෙරට විසඳන්නට ජනවාර්ගික ප්‍රශ්නයක් නැති බව ය. බ්‍රිතාන්‍යයින් විසින් සිංහලයන්ට විරුද්ධව ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා ද, පසුව ප්‍රභාකරන් ද දැන් නැවතත් බටහිර රටවල විසිරී සිටින ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා ද යොදාගෙන සිංහලයන්ට මෙරට හිමිතැන අහිමිකිරීම හැරෙන්නට වෙනත් ප්‍රශ්නයක් මෙරට නැත. කසිකබල් මාක්ස්වාදීන් ද ඊනියා ලිබරල්වාදීන් ද බටහිරයන් සමග එකතු ව ඔවුන් අනුකරණය කරමින් දෙන ඊනියා විසඳුම් අප සතපහකටවත් මායිම් කළයුතු නො වේ. එක්සේසත් රාජ්‍යයක පරිපාලනය විමධ්‍යගත වෙයි. ඒ රාජ්‍යය ඒකීය රාජ්‍යයකින් එවැනි කරුණුවලින් වෙනස් වෙයි. පරිපාලනය විමධ්‍යගත කළ යුත්තේ සෑම දෙයකටම ජනයා කොළඹට ඇදී ඒම වැළැක්වීම ද අරමුණු කරමිනි. එහි දී ඒකකය වත්මන් දිස්ත්‍රික්කයකට වඩා කුඩා විය යුතු අතර ජනතා නියෝජිතයන් නොව ජනතාව මැදිහත්වීමෙන් පරිපාලනය සිදුවිය යුතු ය. ඒ අතර පරිපාලනය විමධ්‍යගත කළ යුත්තේ සංවර්ධනය ඉලක්ක කරගනිමිනි. එහෙත් මෙහි දී ප්‍රශ්නයක් පැන නගී. සංවර්ධනය යනුවෙන් අප අදහස් කරන්නේ කුමක් ද? සත්තකින් ම ඒ බටහිර සංවර්ධනය නම් නො වේ.

ඒ සංවර්ධනය අපේ සංවර්ධනයක් විය යුතු ය. ඒ පිළිබඳ දීර්ඝ විස්තරයක් කිරීමට මේ අවස්ථාව නො වේ. මිනිසා මිනිසා අතර මෙන් ම මිනිසා හා සත්වයා අතර ද ගහකොළ සමග ද පොදුවේ ගත්කළ ස්වභාවධර්මය

© Prof. Nalin De Silva

සමග සහජීවනයක් ඒ සංවර්ධනයෙන් අපේක්‍ෂා කෙරේ. ඒ කිසිසේත් ම ඊනියා හරිත සංවර්ධනයක් නො වේ. බටහිර පට්ට ගැසූ හරිත සංකල්පය පරිසර කළමනාකරණය පිළිබඳ සංකල්පයක් පමණකි. බටහිරයන්ට අද ඇත්තේ රෝගවල සිට පරිසරය දක්වා කළමණාකරණය පිළිබඳ සංකල්ප මිස ඒ ඒ ප්‍රශ්නවලට විසඳුම් නො වේ. මේ සංවර්ධනයේ තවත් පැත්තක් ද සඳහන් කළ යුතු ය. බටහිර සංවර්ධනයේ පදනම වනුයේ වෙන්කිරීම, පෞද්ගලිකත්වය වර්ධනය කිරීම, හැඟීම්වලට ඉඩදීම, ඉන්ද්‍රිය පිනවීම ආදිය ය. අපේ සංවර්ධනයක් මෙයට වඩා වෙනස් මැදමාවතක් අනුගමනය කරන්නක් විය යුතු ය. ඒ සංවර්ධනයේ එක් පැත්තක ඉහත සඳහන් දෑ තැවීම ද වෙයි. ඒ තවුසන් සඳහා ය. පෘථග්ජන ගිහියන් සඳහා අවශ්‍ය වන්නේ මැදමාවතකි. මේ පිළිබඳ ව අපි පසුව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමු. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට බලය බෙදීම ආදී වශයෙන් විසඳුම් සෙවීම අප තව තවත් පඹගාලක පැටලීමක් පමණකි. උතුරු හා නැගෙනහිර පළාත්වලට බලය බෙදීමෙන් කොළඹ හා කඳුකරයේ ජීවත්වන දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්න විසඳන්නේ කෙසේ ද? යෝජිත විසඳුම ඊනියා ප්‍රශ්නයට විසඳුමක් නොවන කල ප්‍රශ්නය ගැන ම ප්‍රශ්න ඇති නොවන්නේ ද? දෙමළ ජනයාට දෙමළවීම නිසාම ඇති ප්‍රශ්නයක් නැතැයි අපි මුල සිට ම අවධාරණය කෙළෙමු. යම්කිසිවකු අද දෙමළ ජනයාට ඇති ප්‍රශ්න ගැන මුල සිට කතාකිරීමට උත්සාහ ගන්නේ නම් ඒ උත්සාහය වහාම පරාජය කළ යුතු ය. දෙමළ ජාතිවාදය ගැන මේ තීරුවේ ලියැවුණු ලිපි කිහිපයක් දැනට මාස හයකට පමණ පෙර දෙමළ ජාතිවාදයට එරෙහිව නමින් පොතක් වශයෙන් පළ කෙරුණේ ඇතැමුන් එසේ පොතක් ඇත්නම් පරිහරණය කිරීම පහසු යැයි කී බැවිනි. එහෙත් ඒ පොත එතරම් පරිහරණයක් කෙරෙන බවක් නම් නොපෙනෙන්නේ එහි කිවයුතු තරම් අළෙවියක් නොමැති බැවිනි. වත්මන් ආර්ථික ආකල්ප අනුව රුපියල් හතළිහක් ගෙවා පුවත්පතක් මිළ දී බොහෝ දෙනකුගේ අදහස් කියවීම රුපියල් තුන්හාරසීයක් ගෙවා පොතක් මිළ දී තනි පුද්ගලයකුගේ අදහස් කියවීමට වඩා ප්‍රතිලාභයක් අත්කරදීම එයට හේතුව විය හැකි ය. එසේත් නැත්නම් මේ ලිපිවල පුවත්පතෙන් කියවීමට තරම්වත් හරයක් නැතැයි සිතිය හැකි ය.

පරිපාලනය විමධ්‍යගත කිරීම හා ඊනියා ජනවාර්හික ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීම පසුවට කල්දමා මැතිවරණයට අදාළ සෘජු ප්‍රශ්නයක් ගැන අවධානය යොමු කරමු. බටහිරයෝ බෑන් කි මුන් ලවා ඊනියා නිරීක්‍ෂක මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කරති. ඒ එක් පැත්තකින් සරත් ෆොන්සේකා වෙනුවෙනි. එයට කිසිසේත් ඉඩ නොදිය යුතු ය. අද බටහිරයන්ගේ ප්‍රධානතම සුරතලා වී ඇත්තේ අනුර කුමාර (ජ වි පෙ)- සරත් ෆොන්සේකා - සරත් සිල්වා - අර්ජුන රණතුංග ෆැසිස්ට්වාදී දේශපාලන ධාරාව ය. මහවිනිසුරු පදවියෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව සරත් සිල්වා අද සරත් ෆොන්සේකාගේ ගොඩ පෙරකදෝරුවා බවට පත් වී ඇත. මේ දේශපාලන ධාරාව ආරම්භයේ දී (ෆොන්සේකා නැතිව එහෙත් මංගල ඇතිව) ජ වි පෙ හා මංගල ආණ්ඩුවෙන් කැඩී යෑම හා නඩු තීන්දුවල තේමාව වෙනස්වීම ගැන අපි සඳහන් කෙළෙමු.

සරත් සිල්වා යනු විනිසුරුවකු ලෙස සේවය කළ දේශපාලනඥයෙක් විය. අද ඔහු හුදු දේශපාලනඥයෙක් වෙයි. ඔහුගේ පමණක් නොව කාගේත් දේශපාලනය අනුව නීතිය පිළිබඳ දෙන විවරණ වෙනස් වෙයි. ඊනියා බුද්ධිවාදීන් නොදනිතත් ක්වොන්ටම් භෞතිකයේත් විවරණ පෞද්ගලික රුචි අරුචිකම් හා දර්ශනය හා සංස්කෘතිය මත පදනම් වන විට නීති විවරණ ගැන කියනුම කවරේ ද? සරත් යුගලයේ සිල්වාට අද ප්‍රශ්නය වී ඇත්තේ ෆොන්සේකාට විරුද්ධව යුද අධිකරණය ඉදිරියේ විභාග වන නඩු ය. මේ පිළිබඳ වත්මන් ශ්‍රේෂ්ඨාධිකරණය දැනටමත් යුද අධිකරණයේ නීත්‍යානුකූලභාවය පිළිබඳ අතුරු තීන්දුවක් දී ඇත. නඩුව තවමත් විභාග වෙමින් පවතියි. එහෙත් සිල්වා ඉන් සෑහීමකට පත් වී නැත. තමා දැන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලේ සාමාජිකයකු නොවන බව සිල්වාට අමතක වී ඇති සේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ඇති නඩු ගැන ඔහු අලුත්කඩේ නොගොස් ෆොන්සේකා වෙනුවෙන් පරණකඩේ යයි. ඔහුගේ තර්කය අනුව ජෙනරාල්ලාට නිලධාරීන් හෝ සොල්දාදුවන් හෝ නොවන සාමාජිකයන් ලෙස යුදහමුදාවේ සිටිය හැකි ය. කෙසේ වෙතත් යුදහමුදාවේ සාමාජිකයන් කවු ද යන්න තීරණය කරන්නේ ඔහු නො වේ. ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඇති නඩුවක් සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශකිරීම උසාවියට අපහාස කිරීමක් දැයි අපි නො දනිමු. ඒ එසේ නම් ඔහු දැරූ නිලය නොතකා ඔහු උසාවිය ඉදිරියට පැමිණවිය යුතු ය. බටහිරයන්ගේ සෘජු සහාය ලැබෙන ෆැසිස්ට්වාදී ධාරාවට 2% කවත් ඡන්දයක් නොලැබෙනු ඇත. සාමාන්‍යයෙන් ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයක් ලබාගැනීමට 3.5%කට ආසන්න ඡන්ද ප්‍රමාණයක් ලබාගත යුතු ය. ෆැසිස්ට්වාදී ධාරාවට මන්ත්‍රී ධුරයක් ලැබෙතොත් ඒ ශේෂයට මිස ප්‍රතිශතයේ පූර්ණ සංඛ්‍යා කොටසට නො වේ. එසේ ලැබුණහොත් බටහිරයන් නොදනිතත් ෆැසිස්ට් ධාරා අක්‍ෂය නැවතත් කැඩී බිඳී යෑමට විශාල ඉඩකඩක් ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva